# පැරකුම් ගැමුණු යුග ගෙන එමු යලි කැන්දා

පැරකුම් සමුදුරේ නිල් දිය දහර මත
සඳරැස් වැටී දිලිසෙන යුරු අපරි මිත
බලමින් සොබා සිරිවිද ගල් කුලක් මත
සරසවි දේවියට ඇරයුම් කරයි සිත

හෙළ පරපුරේ කුස ගින්දර මැඩලන්න
මේ දිය දහර කැපවෙයි කෙත් සරසන්න
පැරකුම්. වසග නිරිඳුන් සිහි කරමින්න
පුදමෙනම් කවි කුසුම් බැතියෙන් පිළිගන්න

පුලතිසිපුරේ ගොවි දහදිය වැගිරෙන වා
කෙත්වතු සරු වෙමින් පලබර වී එන වා
සැම නිවසකම සිරි දෙවි දුව රජ වෙන වා
හෙළ ගොවි පරපුරේ දස්කම් පැවසන වා

කාලෙට වගාකර යල මහ සරුවීම
යායට වගා කර සමගිය ඇතිවීම
නුමුහුන් බීජ සැම කෙතකම වැපිරීම
සිහියේ තබා ගතයුතු වෙයි සැමදාම

ජල පිරිමැස්ම නම් අමතක කරනු එපා
වනාත් ඇල වේලි වනගත කරනු එපා
ආවට ගියාවට මැහිතෙල් ඉසිනු එපා
හිතකර සතුන් කිසිවිට වනසන්න එපා

බිම් සැකසීම ගැඹුරට කළයුතු වන්නේ
මූලික පොහොර පදමට එක් කරමින්නේ
නිසි පරතරය පැල අතරට තබ මින්නේ
එහෙමයි සොයුර ගොවිතැන් කළයුතු වන්නේ

මතුපිට පොහොර යෙදවුම නම් ඉතා හොඳයි
යූරියා වැඩි වුනොත් මිතුරේ බලා ගෙනයි
වැඩිවන කොළඳාව මත රෝ සතුරු කැළයි
අස්වනු අඩුවෙමින් වියදම ඉහළට යයි

කුඹුරේ කෘමි සතුන් ගැන විපිරම් කරලා
සිටිනා සතුරු මිතුරන් ගේ තරම බලා
පාඩුව කොතෙක් වේ දැයි ගණනය කරලා
පමණක් යොදමු කෘමි නාශක ඉදිරි බලා

පැහි කර වෙන්න දෙන්නට හොඳ නැහැ ගොයම
පදමට පාට වෙන විට යුතු වෙයි කැපුම
අස්වනු හැලී නොමවෙයි අපතේ යෑම
පොඩි වෙන්නට නොදී කළයුතු පෑගිම

කුඹුරට පිදුරු ගෙදරට බැත ගෙන ඒම
සියයට දහතුනේ පදමට වියළී ම
අවි. වැසි සුළං මග හැර ගබඩා කෙරුම
ගොවියට බාර වෙයි මේ හැම වගකීම

පෙර හෙළ රජවරුන් සේ මහ වැව් බන්දා
අටු කොටු පිරී යන ලෙස අස්වැනු රන්දා
මහ දාගැබ් සදා දස අත ජය බන්දා
පැරකුම් ගැමුණු යුග ගෙන එමු යලි කැන්දා

කොළඹ 5, නාරාහේන්පිට.
රෝපණ ද්‍රව්‍ය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ
කෘෂිකර්ම නිළධාරි
අප්පුහාමි රත්නායක විසිනි